**කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා) - 2017.**

---

කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ (නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ව්‍යාපෘතිය, ගොඩනැගීම, ක්‍රියාත්මක කිරීම සහ පවරා දීම යන පදනම යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

## 1.1 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.අදියර 02 ක් යටතේ නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කිලෝමීටර 17.3 ක කණු මතින් ඉදිවන අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුලින් රථවාහන තදබදය, ගමන් කාලය අඩු කිරීම, ආයෝජන හා රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම මෙන්ම දරිද්‍රතාව සහ විරැකියාව අවම කිරීමෙන් ආර්ථික කටයුතු මත ධනාත්මක බලපෑම් ඇතිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා වූ අධිවේගී මාර්ගයේ කිලෝමීටර් 6.90 ක්වූ අදියර 01 ඉදිකිරීම සඳහා අපේක්ෂිත පිරිවැය රුපියල් මිලියන 55 ක් ලෙස තීරණය වී තිබුණි. අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2021 නොවැම්බර් මස වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,සහ

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

මෙම ව්‍යාපෘතියේ හා කොන්ක්‍රීට් කණු මත දිවෙන ( Elevated) වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය ලෙස හැඳින්වෙන වෙනත් ව්‍යාපෘතියක ව්‍යාපෘති අධීක්ෂණ ඒකක එකම පරිශ්‍රයක් තුල පිහිටා ඇති අතර, සමාලෝචිත වර්ෂය තුල මැයි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුල දරන ලද එකතුව රු.මිලියන 7.81ක්වූ පොදුකාර්ය පිරිවැය අනෙක් ව්‍යාපෘතියට වෙන්කිරීම හා අයකිරීම වෙනුවට මෙම ව්‍යාපෘතියේ වියදමක් ලෙස අයකර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

ලැබී ඇති තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් රු. මිලියන 186.80 ක් වෙන්කර තිබූ අතර එයින් එකතුව රු.මිලියන 26.78 ක් සමාලෝචිත වර්ෂය තුල වියදම් කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

ව්‍යාපෘතියේ අදියර 01 සඳහා ශක්‍යතා අධ්‍යයනය හා මූලික සැලසුම් කටයුතු දක්ෂිණ මහාමාර්ග දිගුව ව්‍යාපෘතිය නම් වෙනත් ව්‍යාපෘතියක් යටතේ 2015 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර තිබුණි. පාරිසරික බලපෑම් තක්සේරු සැලැස්ම සහ අධිවේගී මාර්ගය සඳහා නැවත පදිංචි කිරීමේ සැලැස්ම පිළිවෙළින් රු.මිලියන 3.94 ක් සහ රු.මිලියන 3.71 ක් වැයකර 2017 පෙබරවාරි 14 දින මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකර තිබුණි. නමුත්, 2018 මැයි 31 දින වන විටත් ඒ පිළිබඳ වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති සේවා තනතුරු 17 න් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක, ප්‍රධාන ඉංජිනේරු, ව්‍යාපෘති ඉංජිනේරු, ප්‍රමාණ මිනින්දෝරු, ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ නිලධාරි සහ තාක්ෂණික නිලධාරි ඇතුලු ප්‍රධාන තනතුරු 12 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩුව පැවතුණි. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවා තනතුරු ලැයිස්තුවට ව්‍යාපෘති ගණකාධිකාරි, ප්‍රසම්පාදන විශේෂඥ වැනි වෙනත් ප්‍රධාන තනතුරු ඇතුලත්කර නොතිබුණි.

## 3.4 ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘතිය ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ මූලික සමීක්ෂණ අවසන්කර තිබුණ අතර ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ අත්පත්කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ අරමුණ සඳහා නිවාස 1,106 ක් ඇතුලත් ඉඩම් කැබලි 786 ක් හඳුනාගෙන තිබුණි. කෙසේවෙතත්, මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබාගැනීම පමාවීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු තවදුරටත් ප්‍රමාද වී තිබුණි.